# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 686 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 22/04/2024 පැය 0530

# මාධ්‍ය නිවේදනය

## 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.

2024.04.21 වන දින සවස් කාලයේ දී තලංගම පොලිස් වසමේ බත්තරමුල්ල ප්‍රදේශයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **අයිස් ග්‍රෑම් 636 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තලංගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. අපරාධයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - බියගම පොලිස් ස්ථානය.

2024.04.21 වන දින රාත්‍රී කාලයේ දී බියගම පොලිස් වසමේ යබරලුව ප්‍රදේශයේදී බියගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 510 ක්** සන්තකයේ තබාගෙන මොටර් රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන බියගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී කිරිඳිවැල පොලිස් ස්ථානයට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය වී ඇති අතර සොරකම් කරන ලද පිත්තල පහන් 01 ක්, පිත්තල මල් බඳුන් 02 ක්, තණකොළ කපන මැෂිමක් හා ගෑස් සිලින්ඩරයක් සොයා ගෙන ඇත.**

බියගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - රාගම පොලිස් ස්ථානය.**

2024.04.21 වන දින රාත්‍රී කාලයේදී රාගම පොලිස් වසමේ සමගි මාවත හා රාගම නගරය ආසන්න ප්‍රදේශවලදී රාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරකට අනුව වැටලීම් 02 ක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 134 ක් (බෝතල් 180 ක්)** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 51 වයස්වල පසුවන රාගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**රාගම** පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාමක් - ආණමඩුව පොලිස් වසම.**

2024.04.21 වන දින සවස් කාලයේ ආණමඩුව පොලිස් වසමේ රඹේයාය ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට ආණමඩුව පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 76 ක් වූ සියඹලාගස්හේන, ආණමඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ආණමඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**05. නාඳුනන මළ සිරුරක් හමුවීම - පැලියගොඩ පොලිස් වසම.**

2024.04.21 වන දින දහවල් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ කැළණි ගඟේ නාඳුනන පිරිමි මෘත ශරීරයක් ඇති බවට පැලියගොඩ පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර අවුරුදු 45 ත් 50 ත් අතර වන උස අඩි 05 යි අඟල් 04 ක් පමණ වන උඩුකයට අළුපාට අත්කොට කමිසයක්ද යටිකයට ලාකොල පාට හා කහපාට කොටු සහිත සරමක්ද ඇඳ සිටි ඇති අතර මුහුණ හඳුනා ගත නොහැකි තත්වයට විරූපී වී ඇත.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. පුරාවස්තු ලබාගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - එරගම පොලිස් ස්ථානය.**

2024.04.21 වන දින උදෑසන කාලයේදී එරගම පොලිස් වසමේ දීඝවාපිය වෙහෙරගල ප්‍රදේශයේදී එරගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු ලබාගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු කැණීම් කිරීම සඳහා උපයෝගී කරගත් දේපල සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27, 32, 39 හා 53 යන වයස්වල පසුවන සමන්තුරේ, කොක්කඩිචෝල හා අම්පාර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

එරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. හදිසි ගින්නක් - හැටන් පොලිස් වසම.

2024.04.21 වන දින සවස් කාලයේදී හැටන් පොලිස් වසමේ ෂැනන් තේ කර්මාන්ත ශාලාවේ හදිසි ගින්නක් හටගෙන ඇති බවට හැටන් පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත වහා ක්‍රියාත්මක වූ පොලිසිය, හැටන් දික්ඔය නගර සභාවේ ගිනි නිවන ඒකකය හා ප්‍රදේශවාසීන්ගේ සහය ඇතිව ගින්න මැඩ පැවැත්වීමට කටයුතු කර ඇත.

ගින්න හේතුවෙන් ජීවිත හානි කිසිවක් සිදුව නොමැති අතර හැටන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - වැල්ලම්පිටිය පොලිස් වසම.

2024.04.21 වන දින අළුයම් කාලයේදී වැල්ලම්පිටිය පොලිස් වසමේ කොළඹ අවිස්සාවේල්ල මාර්ගයේ නාගහවෙල ප්‍රදේශයේදී හඳුනා නොගත් රථයක කාන්තාවක් ගැටී බරපතල තුවාල ලබා වැල්ලම්පිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 68 ක් වූ අංගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි .**

මෘත ශරීරය මුල්ලේරියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - කන්තලේ පොලිස් වසම.

2024.04.21 වන දින උදෑසන කාලයේදී කන්තලේ පොලිස් වසමේ කන්තලේ රජඇල මාර්ගයේ චූලාභය අතුරු මාර්ගයේ ධාවනය වූ වෑන් රථයක් රියදුරුට පාලනය කරගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික කාන්තාව කන්තලේ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 19 ක් වූ රජඇල, කන්තලේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කන්තලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු රියදුරු පලා ගොස් ඇති අතර රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා කන්තලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - නවගමුව පොලිස් වසම.

2024.04.21 වන දින දහවල් කාලයේදී නවගමුව පොලිස් වසමේ කඩුවෙල හංවැල්ල ප්‍රධාන මාර්ගයේ රණාල ප්‍රදේශයේදී ඇඹිලිපිටිය දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ බස්රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක් ගැටී ලොරි රථයට පිටුපසින් පැමිණි යතුරුපැදියක්ද ලොරි රථයේ පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ලොරි රථ රියදුරු යතුරුපැදිකරු, පසුපැදිකාරිය හා බස් රථයේ ගමන් ගත් කාන්තාවක් නවගමුව රෝහලට

ඇතුලත් කිරීමේදී ලොරි රථයේ රියදුරු මියගොස් ඇත .අනෙක් තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය කොළඹ පොලිස් මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නවගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**